ආරක්ෂක අමාත්‍යාංශය
பாதுகாப்பு அமைச்சு
MINISTRY OF DEFENCE
ආරක්ෂක මූලස්ථාන සංකීර්ණය, ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ, ශ්‍රී ලංකාව.
பாதுகாப்பு தலைமையக கட்டிடம், ஸ்ரீ ஜயவர்தனபுர, கோட்டே, இலங்கை.
Defence Headquarters Complex, Sri Jayawardenepura, Kotte, Sri Lanka. *Website : www.defence.lk*

මගේ අංකය / எனது இல / My No: MOD/CSD/SC/1/2026/08/01 (07)

ඔබේ අංකය / உமது இல / Your No:

තැ. පෙ. / த. பெ.டி / P.O. Box 572 | දුරකථන / தொலைபேசி / Telephone 2430860-9, 2430870-8 | ලේකම් / செயலாளர் / Secretary | දුර./தொ./Tel. : 011 2381154, ෆැක්ස්./பெ./Fax.: 011 2541529, වි. තැපැල./மி.அ./Email : secdefence@defence.lk

දිනය / திகதி / Date: 2025.03.19

**චක්‍රලේඛ අංක:-** 2025/01

යුධ හමුදාධිපති,
නාවික හමුදාධිපති,
ගුවන් හමුදාධිපති,
පොලිස්පති,

## ත්‍රිවිධ හමුදා සහ පොලිස් නිලධාරීන්ගේ දරුවන් රජයේ පාසල්වල පළමු ශ්‍රේණියට ඇතුළත් කිරීම - 2026 වර්ෂය

ත්‍රිවිධ හමුදා හා පොලිස් නිලධාරීන් වෙනුවෙන් විශේෂ අනුග්‍රහය යටතේ පාසල් වල පළමු ශ්‍රේණිය සඳහා ළමුන් ඇතුළත් කිරීම වෙනුවෙන් මෙම චක්‍රලේඛයේ සඳහන් කොන්දේසි හා නීතිරීති 2026 වර්ෂයේදී අනුගමනය කරන ලෙස කාරුණිකව දන්වමි.

1. මූලික සුදුසුකම්,

I. 2026 වර්ෂයේ ජනවාරි මස 31 දින වන විට වයස අවුරුදු 5ක් සම්පූර්ණ වන ළමයින් සඳහා පමණක් ඉල්ලුම්පත්‍ර ඉදිරිපත් කළ යුතුය. (සෑම ඉල්ලුම්පතක් සමගම **අනිවාර්යයෙන්ම** උප්පැන්න සහතිකයේ පිටපතක් අමුණා තිබිය යුතුය.)

II. 2025 ජනවාරි මස 31 වන දින වන විට ත්‍රිවිධ හමුදා හා පොලිස් සාමාජිකයින් සඳහා හිමිවන ලකුණු ප්‍රමාණය පමණක් අයදුම්පත් සඳහා සළකා බලනු ලැබේ.

1.1 ළමුන් ඇතුළත් කිරීම සඳහා සුදුසුකම් ලබනුයේ,

i. ක්‍රියාන්විතයේදී මියගිය හා අතුරුදන් වූ අයවලුන්ගේ දරුවන්
ii. ක්‍රියාන්විතයේදී ආබාධිත තත්ත්වයට පත්ව වෛද්‍ය හේතූන් මත විශ්‍රාම ගැන්වූ අයවලුන්ගේ දරුවන්
iii. දැනට සක්‍රිය සේවයේ යෙදී සිටින ත්‍රිවිධ හමුදාවේ හා ශ්‍රී ලංකා පොලිසියේ අයවලුන්ගේ දරුවන්
iv ඉහත i, ii, iii, යන කරුණු වල සඳහන් අයවලුන්ගේ දරුවන් සඳහා ප්‍රමුඛත්වය ලබා දී ඉතිරි වන පුරප්පාඩු සඳහා, 2009 වර්ෂයට පෙර ක්‍රියාන්විත සේවයට බැඳී සිට වසර 22ක අවම සේවා කාලයකින් පසු විශ්‍රාමගිය නිලධාරීන්ගේ හා වසර 15ක අවම සේවා කාලයකින් පසු විශ්‍රාමගිය නිලධාරිනියන්ගේ දරුවන්

2. අයදුම්පත්‍ර ඉදිරිපත් කිරීම.

2.1. පළමු ශ්‍රේණියට දරුවන් ඇතුළත් කරගැනීමට අදාළ අයදුම්පත් ත්‍රිවිධ හමුදා හා පොලිසියේ අදාළ ස්ථාන වලින් හා ආරක්ෂක අමාත්‍යාංශයේ (www.defence.lk) වෙබ් අඩවියේ හා අනෙකුත් හමුදාවන්ගේ හා පොලිසියේ වෙබ් අඩවි වලින් (www.army.lk, www.navy.lk, www.airforce.lk, www.police.lk) ලබා ගැනීමට අවශ්‍ය පහසුකම් මේ වනවිට සලසා තිබිය යුතුය. **(ආකෘතිය A)**

2.2 ඉල්ලුම්පත්‍රය ඉදිරිපත් කළ හැක්කේ අදාළ ත්‍රිවිධ හමුදා හෝ පොලිස් නිලධාරියාට පමණි. අදාළ සාමාජිකයා මියගොස් ඇත්නම් පමණක් කලත්‍රයාට හෝ නීත්‍යානුකූල භාරකරු හෝ අයදුම්පත් ඉදිරිපත් කළ යුතුය.

2.3 සම්පූර්ණ කරන ලද අයදුම්පත්‍ර අදාළ පහසුකම් සපයා තිබූ ස්ථාන හරහා සුභසාධක අධ්‍යක්ෂ වෙත යොමුකළ යුතු අතර, සෘජුවම ආරක්ෂක අමාත්‍යාංශය හෝ අධ්‍යාපන අමාත්‍යාංශය වෙත කිසිදු හේතුවක් මත අයදුම්පත් ඉදිරිපත් නොකළ යුතුය. රෙජිමේන්තු භාර නිලධාරීන් විසින් තමා වෙත ලැබෙන අයදුම්පත් නිර්දේශ කර සුභසාධක අධ්‍යක්ෂ මණ්ඩල වලට යොමු කිරීමේදී එම අයදුම්පත් සම්බන්ධව විධිමත් ලේඛනයක් පවත්වා ගත යුතුය.

2.4 ඉදිරිපත් කරන සෑම අයදුම්පතක් සඳහාම යොමු අංකයක් ලබාදිය යුතු අතර, ඉල්ලුම්පත්‍රය ලැබුණු බවට දැනුම්දීමේදී එම යොමු අංකය ඉල්ලුම්කරු වෙත දැනුම් දිය යුතුවේ. ඉදිරියේදී මෙම අයදුම්පත් සම්බන්ධ සියළු කටයුතු වලදී එම අංකය භාවිතා කළ යුතුය.

2.5 අයදුම්කරුට තම කැමැත්ත අනුපිළිවෙළ අනුව පාසල් 10 ක් ඉල්ලුම් කළ හැක. මෙම පාසල් නම් කිරීමේදී ඒවායේ පළමු වන ශ්‍රේණිය පැවැත්වෙන බවට තහවුරු කරගත යුතුවේ. තවද දරුවාගේ ස්ත්‍රී පුරුෂ භාවය, භාෂා මාධ්‍ය හා ආගම පිළිබඳව විශේෂ අවධානයක් යොමුකර පාසල් තෝරාගැනීම සිදුකළ යුතුය.

2.6 අයදුම්පත් ඉදිරිපත් කිරීමේදී එහි සඳහන් පාසලේ නම හා කාණ්ඩ අංකය අතර පරස්පරතාවයක් පවතීනම් ප්‍රමුඛතාවය ලබාදෙනුයේ පාසලට හිමි කාණ්ඩ අංකය සඳහාය. එබැවින් පාසල් කාණ්ඩ අංක නිවැරදිව සටහන් කළ යුතුය.

2.7 උසාවි තීන්දුවකින් දරුවෙකු කුලවද්දා ගැනීමේදී, නීත්‍යානුකූලව කුලවද්දා ගැනීම සිදු කරනු ලබන නිලධාරියා විසින් අයදුම්පත් ඉදිරිපත් කරන ලද අවස්ථාව වන විට දරුවා කුලවද්දා ගැනීම සඳහා අදාළ උසාවි තීන්දුව ලබා තිබීම හෝ කුලවද්දා ගැනීමට අදාළව නඩුවක් පවරා තිබිය යුතුය. එසේ නඩු පවරා ඇති අවස්ථාවක අධ්‍යාපන අමාත්‍යාංශ චක්‍රලේඛයේ 4.5 වගන්තිය අනුව අයදුම්පත් ඉදිරිපත් කරනු ලබන වර්ෂයේ ජුනි 30 දිනට පෙර ලබා අදාළ නඩු තීන්දුව ලබා තිබිය යුතුය. ඉන් පරිබාහිරව අදාළ වගන්තිය යටතේ සඳහන් කරුණු තරයේ පිළිගත යුතුය.

2.8 කොළඹ 03 පිහිටි ආරක්ෂක සේවා විද්‍යාල හා කුරුණෑගල ආරක්ෂක සේවා විද්‍යාලයට ඇතුළත් වීම සඳහා ඉල්ලුම් කරන්නේ නම් ඊට අදාළ **විශේෂිත අයදුම්පත් අදාළ ස්ථාන තුළින් ලබාගෙන** අදාළ සුභසාධක අධ්‍යක්ෂ මණ්ඩලය වෙත යොමු කළ යුතු අතර, මෙම පදනම මත රජයේ පාසල් සඳහා ඉදිරිපත් කරනු ලබන අයදුම්පත තුළ සටහන් කරන පාසල් 10 තුළට එම විද්‍යාල දෙක ඇතුළත් නොකළ යුතුය.

2.9 එක් අයදුම්කරුවෙකු විසින් **එක් අයදුම්පතක් පමණක්** සම්පූර්ණ කළ යුතු අතර, එම අයදුම්පත ආරක්ෂක අමාත්‍යාංශයටද, එහි සුභසාධක අධ්‍යක්ෂ විසින් සත්‍ය පිටපතක් ලෙස සහතික කරන ලද ඡායා පිටපත් අධ්‍යාපන අමාත්‍යාංශයටද, අදාල හමුදාවන්ට හා ශ්‍රී ලංකා පොලිසියෙහි සුභසාධක අධ්‍යක්ෂක මණ්ඩලයටද ඉදිරිපත් කළ යුතුය.(එක් පිටපතක් අයදුම්කරු ළඟ තබාගත යුතුය.)

2.10 මෙම විශේෂ අනුග්‍රහය පදනම මත පළමු වසරට දරුවන් ඇතුළත් කිරීමේදී අයදුම්කරුවන්ගේ ක්‍රියාත්මක සේවා කාලයට ප්‍රමුඛතාවය ලැබෙන අතර ලකුණු ලබාදීමේදී ආසන්න පදිංචිය සලකා බලනු නොලැබේ. එබැවින් තම දරුවන් ඇතුළත්

කිරීමට අපේක්ෂිත පාසලට ආසන්නයේ ඉල්ලුම්කරු පදිංචිව සිටීනම් ගෘහමුලික පදනම මත හෝ ආදි ශිෂ්‍ය පදනම මත හෝ සහෝදර පදනම මත යන කරුණු මත මෙම පදනමට පරිබාහිරව විදුහල්පති වෙත ඉල්ලුම්පත්‍ර ඉදිරිපත් කළ යුතුයි.

2.11 අයදුම්පත ඉදිරිපත් කරන අවස්ථාව වන විට රාජකාරි හෝ පුද්ගලික කරුණක් සඳහා විදේශ නිවාඩු ලබා විදේශගතව සිටින නිලධාරීන්ගේ දරුවන් සඳහාද මෙම පදනම යටතේ අයදුම්පත් ඉදිරිපත් කළ හැකිය. කෙසේ වුවද දෙමාපියන් දෙදෙනාම ශ්‍රී ලංකාවේ නොමැති නම්, ඔවුන් විසින් නීත්‍යානුකූලව (ඇටෝර්නි බලපත්‍රයක් මගින්) දරුවාගේ භාරකාරත්වය පවරනු ලබන පුද්ගලයෙකු විසින් අයදුම්පත්‍රය ඉදිරිපත් කළ හැකිය. දරුවා පාසල වෙත තේරීමෙන් පසු පළමු ශ්‍රේණිය සඳහා පාසල් ආරම්භ කරන අවස්ථාවේදී දරුවා පාසල වෙත ඇතුළත් කළ යුතු අතර, එසේ ඇතුළත් කළ නොහැකි වුවහොත් ඉන් පසුව ලැබෙන අභියාචනා සලකා බලනු නොලැබේ.

2.12 සම්පූර්ණ කරන ලද අයදුම්පත්‍රය 2025.05.20 දිනට පෙර සුභසාධක අධ්‍යක්ෂ වෙත ඉදිරිපත් කළ යුතුය.එදිනෙන් පසුව ඉදිරිපත් කරනු ලබන අයදුම්පත්‍ර සලකා බලනු නොලැබේ.

3. ලකුණු ලබාදීමේ ක්‍රමවේදය.

3.1. ලකුණු ලබාදීමේ පටිපාටිය.

3.1.1 මියගිය හෝ අතුරුදහන් වීම, ආබාධිත තත්ත්වය, ක්‍රියාන්විතයේ සේවා කාලය, සේවයේ යෙදී සිටි සම්පූර්ණ සේවා කාලය, නිලය, පදක්කම්, ක්‍රීඩා තරඟ හා කලත්‍රයා යන කරුණු ද සැලකිල්ලට ගෙන ත්‍රිවිධ හමුදා සහ පොලීසියට පොදුවන සේ අදාළ ලකුණු ලබාදීමට කටයුතු කළ යුතුය.

3.1.2 තවද, සහෝදර පදනම හා ආදි ශිෂ්‍ය පදනම යන කරුණු, ලකුණු ලබාදීමේදී අදාළ කර නොගත යුතුය.

3.1.3 මෙම පදනම මත පළමු පන්තියට දරුවන් ඇතුළත් කිරීමට අදාළව ඔබ වෙත ආරක්ෂක අමාත්‍යාංශයේ අනුමැතිය සහිතව ලබාදී ඇති ක්‍රමවේදයට අනුව ලකුණු ලබාදීම සිදුකළ යුතු අතර එයට පාරිබාහිරව කිසිදු අවස්ථාවක ලකුණු ලබාදීමට කටයුතු සිදුකිරීම නොකළ යුතු බව අවධාරණය කෙරේ.

3.1.4 සියලුම ලකුණු ලබාදීමේ හා තෝරාගැනීමේ පිළිවෙත් වඩාත් සාධාරණ හා විනිවිදභාවයකින් යුක්ත විය යුතුය. තවද ලකුණු ලබාදීමේ ක්‍රමවේදය සම්බන්ධව සියළුම නිලධාරීන් හා සෙසු නිලයන් දැනුවත් කිරීමට අදාළ සුභසාධක අධ්‍යක්ෂවරුන් කටයුතු කළ යුතු අතර ඉල්ලුම්පත්‍රය සමඟ ආරක්ෂක ලේකම්තුමා විසින් අනුමත කරන ලද ලකුණු ලබාදීමේ ක්‍රමවේදයේ පිටපතක් ලබාදිය යුතුය.

3.1.5 ත්‍රිවිධ හමුදා හා ශ්‍රී ලංකා පොලිසිය අයවලුන් සඳහා සම්මුඛ පරීක්ෂණ පවත්වා, සියළු ලේඛන පිළිබඳව තහවුරු කරගත යුතු අතර, ලකුණු ප්‍රමාණයන් සටහන් කරන ලද මුල් පිටපත සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයේ සියළු සාමාජිකයින්ගේ අත්සනින් යුතුව ආරක්ෂක අමාත්‍යාංශය වෙත යොමු කළ යුතුය.

3.1.6 ත්‍රිවිධ හමුදා හා ශ්‍රී ලංකා පොලිසිය තුල පවතින තෝරාගැනීමේ ක්‍රමවේදය අනුව තේරීම් කටයුතු සිදුකළ යුතුය. කෙසේ වුවද එම ක්‍රමවේදය ආරක්ෂක අමාත්‍යාංශය වෙත ලිඛිතව ඉදිරිපත් කිරීමට කටයුතු කළ යුතුය.

3.1.7 සම්මුඛ පරීක්ෂණයේදී එම ත්‍රිවිධ හමුදා හා පොලිස් අයවලුන් ලබා ගන්නා ලකුණු ප්‍රමාණය පිළිබඳ එම අයවළුන් වෙන් වෙන්ව දැනුවත් කර එම ලකුණු නිවැරදි බවට හා දුටු බවට ඔවුන්ගේ අත්සනින් අදාළ අයදුම්පතෙහි අත්සන් කර තිබිය යුතුය.

3.1.8 මුල් පිටපතෙහි ඇති ලකුණු විස්තර සහිතව දක්වා ඇති මෘදු පිටපතක්ද ආරක්ෂක අමාත්‍යාංශය වෙත යොමුකළ යුතුය.

3.1.9 ඉල්ලුම්කරුවන් ලබාගත් ලකුණු ප්‍රමාණයන් සඳහන් මුල් පිටපතෙහි ඇති ලකුණු සමඟ අයදුම්පතෙහි ඇති ලකුණු සමාන වේ දැයි පරීක්ෂා කිරීමෙන් පසු ආරක්ෂක අමාත්‍යාංශ වෙබ් අඩවිය (www.defence.lk) හා අනෙකුත් අදාළ වෙබ් අඩවිවල (www.army.lk, www.navy.lk, www.airforce.lk, www.police.lk) තාවකාලික ලකුණු ලැයිස්තුව ප්‍රසිද්ධ කළ යුතුය.

3.2. ලකුණු සංශෝධන.

3.2.1 ලකුණු ලබාදීමේ දී යම් අයෙක් තමාට සම්මුඛ පරීක්ෂණයේදී ලැබුණු ලකුණු හා අන්තර්ජාලයේ සඳහන් ලකුණු පිළිබඳව පරස්පරතාවයක් ඇත්නම් ලකුණු ප්‍රසිද්ධ කරන ලද දිනයෙහි සිට **සති දෙකක කාලයක්** ඇතුළත අදාළ සුභසාධක අධ්‍යක්‍ෂ වෙත ඉල්ලීමක් ඉදිරිපත් කළ හැකිය. එම කාලසීමාවෙන් පසු ඉදිරිපත් කරන ඉල්ලීම් පිළිබඳ සලකා බලනු නොලැබේ.

3.2.2 තාවකාලික ලකුණු ලේඛනයෙහි ඇති විෂමතා සඳහා අභියාචනා භාරගැනීමෙන් පසු සකස් කරන ලද අවසන් ලකුණු ලැයිස්තුව අදාළ හමුදාවන්ගේ හා ශ්‍රී ලංකා පොලිසිය සතු වෙබ් අඩවිවල හා ආරක්ෂක අමාත්‍යාංශයේ වෙබ් අඩවියෙහි ප්‍රසිද්ධ කරන අතර අවසන් ලකුණු ලේඛණය නිකුත් කිරීමෙන් පසු ලකුණු සංශෝධනය සඳහා ලැබෙන අභියාචනා සලකා බලනු නොලැබේ.

3.2.3 අවසන් ලකුණු ලැයිස්තුව අනුව අධ්‍යාපන අමාත්‍යාංශය විසින් සකස්කළ තාවකාලික පාසල් ලේඛනය අදාළ හමුදාවන්ගේ හා ශ්‍රී ලංකා පොලිසිය සතු වෙබ් අඩවිවල හා ආරක්ෂක අමාත්‍යාංශයේ වෙබ් අඩවියෙහි ප්‍රසිද්ධ කළ යුතුය.

4. අභියාචනා හා විරෝධතා.

4.1 එකී තාවකාලික පාසල් ලේඛනය වෙබ් අඩවි වල ප්‍රසිද්ධ කිරීමෙන් පසු ලැබී ඇති පාසල් පිළිබඳව සෑහීමකට පත් නොවන අවස්ථාවක **B ආකෘති පත්‍රයට** අනුව අදාළ අභියාචනා තාවකාලික ලේඛණය ප්‍රසිද්ධ කල දින සිට **සති දෙකක කාලයක්** තුළ සුභසාධක අධ්‍යක්‍ෂ වෙත ලැබීමට සැළැස්විය යුතුය.

4.2 අභියාචනා ඉදිරිපත් කළ හැක්කේ පහත සඳහන් කරුණු අනුව පමණි.

I. ඉල්ලුම් කළ කිසිදු පාසලක් නොලැබී තිබීම මත පුරප්පාඩු පවතින පාසලක් ඉල්ලීම සඳහා

II. අයදුම්පත්‍රය ඉදිරිපත් කළ පසු අදාළ නිලධාරියා සඳහා ස්ථාන මාරුවීම් ලැබී ඇති අවස්ථා වලදී හෝ වෙනත් හේතු මත ලබා දී ඇති පාසල වෙනුවට පුරප්පාඩු පවතින වෙනත් පාසලක් ඉල්ලීම සඳහා

III. නිවුන් දරුවන්ගේ ගැටළු නිරාකරණය සඳහා.

IV. අයදුම්පත්වල සංශෝධනයන් සඳහා. (අයදුම්පත් අංකය, සේවා අංකය, අයදුම්කරුගේ නම, දරුවාගේ නම, පුද්ගලික ලිපිනය, ජා. හැ. අංකය, දුරකථන අංකය)

V. පාසලේ කාණ්ඩ අංකය අයදුම්පත සමඟ නොගැලපේ නම් සංශෝධනය කිරීම සඳහා.

VI. කිසිදු පාසලක් අවශ්‍ය නොවන අයවලුන් සඳහා

ඉහත කරුණු සම්බන්ධයෙන් පමණක් අභියාචනා ඉදිරිපත් කළ යුතු අතර නියමිත කාලසීමාවෙන් පසු ඉදිරිපත් කරනු ලබන අභියාචනා සලකා බලනු නොලැබේ.

4.3 ඉහත 4.2 හි (II) කරුණ සලකා බැලීමේදී අයදුම්පත් ඉදිරිපත් කරනු ලබන නිලධාරියාගේ ස්ථානමාරු පිළිබඳව පමණක් සලකා බලන අතර කලත්‍රයාගේ ස්ථාන මාරු සලකා බලනු නොලැබේ.

4.4 ඉහත 4.2 හි අභියාචනා සලකා බැලීමෙන් අනතුරුව සිදු කරන සංශෝධන ආරක්ෂක අමාත්‍යාංශය විසින් අධ්‍යාපන අමාත්‍යාංශය වෙත දැනුම් දෙනු ලැබේ.

5. අවසන් පාසල් ලේඛනය හා පොරොත්තු ලේඛනය ඉදිරිපත් කිරීම.

5.1 4.4 හි ලබාදුන් සංශෝධනද ඇතුළත් කළ අවසන් පාසල් ලේඛනය අධ්‍යාපන අමාත්‍යාංශය විසින් නිකුත් කරනු ලැබේ. කිසිදු හේතුවක් මත අවසන් පාසල් ලේඛනය සංශෝධනය කරනු නොලැබේ. ඉන්පසුව ලැබෙන අභියාචනා අධ්‍යාපන අමාත්‍යාංශය හා ආරක්ෂක අමාත්‍යාංශය වෙත සෘජුව ඉදිරිපත් නොකළ යුතු අතර පුරප්පාඩු පවතින පාසැල් සඳහා පමණක් අභියාචනා සුභසාධක අධ්‍යක්ෂක වෙත ඉදිරිපත් කළ හැක.

5.2 අවසන් පාසල් ලේඛනය අනුව ත්‍රිවිධ හමුදා හා ශ්‍රී ලංකා පොලිසිය විසින්, **C ආකෘතිය** අනුව දෙමාපියන් වෙත ලැබී ඇති පාසල පිළිබඳව දන්වමින් වෙන වෙනම ලිපි නිකුත් කළ යුතුය.

5.3 අවසන් පාසල් ලේඛනයෙහි දෘඪ පිටපත් අධ්‍යාපන අමාත්‍යාංශයේ හා ආරක්ෂක අමාත්‍යාංශයේ බලයලත් නිලධාරීන් දෙදෙනෙකුගේ අත්සන හා නිලමුද්‍රාව සහිතව පාසල් වෙත නිකුත් කළ යුතුය.

5.4 ත්‍රිවිධ හමුදා හා ශ්‍රී ලංකා පොලිසියේ අයවලුන් සඳහා පාසල් වෙන් කිරීමෙන් පසු ඉතිරිවන පුරප්පාඩු ඇතුළත් පුරප්පාඩු ලේඛනය හා පොරොත්තු ලේඛනය අධ්‍යාපන අමාත්‍යාංශය විසින් නිකුත් කළ යුතුය.

6. පුරප්පාඩු සඳහා ළමුන් ඇතුළත් කිරීම.

6.1 5.1 හි අවසන් පාසල් ලේඛනය අනුව කිසිදු පාසලක් හිමි නොවන අයවලුන් සඳහා 5.4 හි සඳහන් පාසල් පුරප්පාඩු ලේඛනය අනුව පාසලක් ලබාදීම අදාළ සුභසාධක අංශ විසින් සම්බන්ධීකරණය කළ යුතුය.

6.2 මෙම අමාත්‍යාංශය මගින් ලබා දෙනු ලබන කාලසටහනට අනුව අයදුම්පත් කැඳවීම, සියළුම ලකුණු ලේඛන, තාවකාලික පාසල් ලේඛන, අවසන් පාසල් ලේඛන නියමිත දිනයන් තුළදී නිකුත් කරනු ලබනු අතර, නොවැළැක්විය හැකි හේතූන් මත පමණක් ආරක්ෂක අමාත්‍යාංශයේ හා අධ්‍යාපන අමාත්‍යාංශයේ අනුමැතිය ඇතිව දිනයන් සංශෝධනය කර ගත යුතුය.

6.3 තේරී පත්වී ඇති යම් දරුවෙකු එම පාසල වෙත ඇතුළත් නොකිරීමට යම් සාමාජිකයකු අදහස් කරන විට නොපමාව අදාළ සුභසාධක අධ්‍යක්ෂකවරු වෙත දැන්වීම සඳහා සුදුසු අභ්‍යන්තර වැඩ පිළිවෙලක් සකස් කළ යුතුය.

6.4 තේරී පත්වී ඇති පාසල් සඳහා තම දරුවන් අදාල පාසලේ ඇතුළත් කරගැනීමේ කටයුතු ආරම්භවන දින සිට මෙම අමාත්‍යාංශයෙන් වැඩ කටයුතු අවසන් කිරීම සඳහා ලබා දී ඇති දිනට පෙර පාසල සඳහා ඇතුළත්කර අවසන් කළ යුතුය. එම කාලසීමාවන් තුළ දරුවන් ඇතුළත් නොකරන අයවලුන් අදාල පාසල් අවශ්‍ය නොවන අයවලුන් ලෙස සලකන බවට ඔවුන් දැනුවත් කළ යුතුය.

6.5 අවසන් පාසල් ලේඛනය අනුව සිසුන් ඇතුළත් කළ හා හඳුනාගත් පුරප්පාඩු සඳහා පොරොත්තු ලේඛනය අනුව සුදුසුකම් ලබන අයවලුන්ගේ දරුවන් නම් කර සුභසාධක අධ්‍යක්ෂක මණ්ඩලයේ නිර්දේශ සහිතව ආරක්ෂක අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කළ යුතුය.

6.6 පොරොත්තු ලේඛනයේ ඉහළින් සිටින අයෙකු අභිබවා ඊට පහළ අයෙකුගේ නම නිර්දේශ කිරීමේදී ඉහළ ලකුණු මට්ටම හිමි සියලුම අයවලුන් විසින් තමාට ලැබී ඇති අවස්ථාව අභිබවා ඊට අඩු ලකුණු මට්ටමක් හිමි නිර්දේශිත පුද්ගලයාට ලබා දීම සම්බන්ධව විරුද්ධතාවයක් නොමැති බවට දිවුරුම් ප්‍රකාශයක් ලබා ගත යුතුය.

6.7 කිසිඳු පාසලක් නොලද අයවලුන් විසින් ඉදිරිපත් කරනු ලබන දුක්ගැනිවිලි අනුව පාසලක් ලබාගැනීමට සිදුකරන ඉල්ලීම් නිර්දේශ කළ යුත්තේ පොරොත්තු ලේඛනයක් නොමැති හෝ පොරොත්තු ලේඛනයෙහි සිටින සාමාජිකයින් අදාළ පාසල් සඳහා ඇතුළත් නොකරන බව සඳහන් කරන අවස්ථාවලදී පමණි.

6.8 2026 පෙබරවාරි 28 දිනෙන් පසුව ත්‍රිවිධ හමුදා හා ශ්‍රී ලංකා පොලිසිය අයවලුන්ගේ දරුවන් පළමු ශ්‍රේණියට ඇතුළත් කිරීම සම්බන්ධව කිසිඳු ඉල්ලීමක් සලකා නොබැලෙන අතර ඉන් අනතුරුව ඉතිරි වන පුරප්පාඩු සම්බන්ධව අධ්‍යාපන අමාත්‍යාංශයේ අංක 25/2024 දරණ චක්‍රලේඛයේ 14.1 වගන්තිය අනුව කටයුතු කළ යුතුය.

7. ක්‍රියාත්මක පදනම මත රජයේ පාසල් වල පළමු ශ්‍රේණියට ළමුන් ඇතුළත් කිරීමේ ක්‍රියාවලිය සම්බන්ධව ත්‍රිවිධ හමුදාවට හා ශ්‍රී ලංකා පොලිසියට පැවරී ඇති සියළු රාජකාරි කටයුතු පිළිබඳව වගකීම සුහසාධක අධ්‍යක්ෂකවරුන් සතු වන අතර, යම් අවස්ථාවක එම අධීක්ෂණ රාජකාරි පැහැර හැරීමක් හෝ චක්‍රලේඛයට පරිබාහිරව ක්‍රියාකිරීමක් සිදු වුවහොත් අදාළ හමුදාපතිවරයා හෝ පොලිස්පතිවරයා විසින් ඒ සම්බන්ධව විනයානුකූලව ක්‍රියාමාර්ග ගැනීම සිදු කළ යුතුය.

**එයාර් වයිස් මාර්ෂල් සම්පත් තුයියකොන්තා (විශ්‍රාමික)**
ඩබ්ලිව්ඩබ්ලිව්වී, ආර්ඩබ්ලිව්පී (තෙවරක්), ආර්එස්පී (දෙවරක්), යූඑස්පී,
එම්එම්එස්සී (උපායමාර්ගික අධ්‍යනය-චීනය), එම්එස්සී (ආරක්ෂක අධ්‍යයන) කළමනාකරණ,
එම්එස්සී (ආරක්ෂක හා උපායමාර්ගික අධ්‍යයන), එෆ්එන්ඩීයූ (චීනය), පීඑස්සී
ලේකම්
ආරක්ෂක අමාත්‍යාංශය

පිටපත් :-

01. අධ්‍යාපන ලේකම් - කරු. අවශ්‍ය කටයුතු සඳහා
02. ජාතික පාසල් අධ්‍යක්ෂ - කරු. අවශ්‍ය කටයුතු සඳහා
03. දත්ත කළමනාකරණ අධ්‍යක්ෂ - කරු. අවශ්‍ය කටයුතු සඳහා
04. සියලුම පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂවරු - කරු. දැනගැනීම සඳහා
05. සුහසාධක අධ්‍යක්ෂ (යුධ/ නාවික/ ගුවන්/ පොලිස්) - කරු. අවශ්‍ය කටයුතු සඳහා